www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මිලිටරිය එල්ටීටීඊ භූමි ප්‍රදේශ යලි අල්ලා ගනු පිනිස මූලික ප්‍රහාරයක් දියත් කරයි

**Sri Lankan military launch major offensive to retake LTTE territory**

**කේ. රත්නායක විසිනි**
**2006 ජුලි 31**

ශ්‍රී ලංකාවේ මිලිටරිය, 2002 දී වත්මන් සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ප්‍රථම වතාවට, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය විසින් පාලනය කරනු ලබන භූමි ප්‍රදේශ අල්ලා ගනු වස් ගොඩ බිම් ආක්‍රමනයක් දියත් කලේ ය. සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරීමක් වන මෙම මෙහෙයුම, පසු ගිය නොවැම්බරයේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂගේ තේරී පත් වීමෙන් අනතුරුව පැන නැගුනා වූ ද අඩු ගනනේ ජීවිත 900ක් බිලි ගෙන ඇත්තා වූ ද දැන් පවත්නා අප්‍රකාශිත යුද්ධය, තව දුරටත් උත්සන්න වීම පිලිබඳ මූලික ප්‍රකාශනයකි.

රාජපක්ෂ ආන්ඩුව මේ සඳහා කඩතුරාව ලෙස යොදා ගෙන ඇත්තේ, නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල නගරයට ආසන්නයේ පිහිටි සේරුනුවර ප්‍රදේශයේ වී ගොවීන් දහස් ගනනකගේ ජල සැපයුම කපා හරිමින්, එල්ටීටීඊ භූමි ප්‍රදේශය තුල මාවිල්ආරුහි පිහිටි සොරොව්වක් වසා දැමීමට ජුලි 20 දා එල්ටීටීඊය ගත් තීන්දුව යි. ආන්ඩුව වහාම මෙම ක්‍රියාව හෙලා දැක්ක අතර, එල්ටීටීඊය අවධාරනය කලේ, 2002 පටන් පොරොන්දු වී ඇති වැවක් ගොඩ නැගීමට ආන්ඩුව අපොහොසත් වීමට විරෝධය පල කරනු වස් මාවිල්ආරු අවට ගොවි ජනයා වෙනුවෙන් මෙම පියවර ගත් බව යි.

එල්ටීටීඊයේ තීන්දුව, රාජපක්ෂගේ දේශපාලන සගයන් වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය ඇතුලු සිංහල ස්වෝත්තමවාදී සංවිධාන වෙතින් විරෝධතා ප්‍රවාහයක් අවුලුවාලී ය. ජවිපෙ නායකත්වයෙන් යුත් දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරය, “තම බලය යොදවා කොටි ත්‍රස්තවාදීන් විනාශ කර අදාල ජලාශයේ සොරොව්ව නැවත ක්‍රියාත්මක කිරීමට ආන්ඩුව පියවර ගත යුතු” යැයි ඉල්ලමින් ජුලි 26 දා නිවේදනයක් නිකුත් කලේ ය.

වැලිකන්දේ සිට ඉදිරියට යන පාබල හමුදාවන්ට සහාය පිනිස මාවිල්ආරු අසල එල්ටීටීඊ ඉලක්කවලට ගුවන් ප්‍රහාර එල්ල කරන ලෙස ආන්ඩුව, එදිනම, ජුලි 26 දා, අන කලේ ය. පසු දින යුද ගුවන් යානා, ත්‍රිකුනාමලයේ සිට කිලෝ මීටර් 40ක් දුරින් කදිරවේලිහි පිහිටි එල්ටීටීඊ කඳවුරකට බෝම්බ දමා එල්ටීටීඊ කේඩර හයක් මරා දමා තවත් ගනනාවකට තුවාල සිදු කලේ ය.

ජුලි 28 දා මෙහෙයුම තීව්‍ර කරන ලෙස මිලිටරිය මත පීඩනය යෙදුනි. අතුරලියේ රතන හා අක්මීමන දයාරත්න යන හෙල උරුමය පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ නායකත්වයෙන් යුත් නඩයක් සොරොව් ගේට්ටුවේ යතුර ඩැහගත් අතර මාවිල්ආරු කරා ගමන් කිරිම සිය අභිප්‍රාය බව ඔවුහු ප්‍රකාශයට පත් කලහ. තමන් ඉක්මනින් ම ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කර ගෙන සොරොව්ව විවෘත කරන බව ප්‍රකාශ කරනු පිනිස, හෙල උරුමයේ ප්‍රකෝපකාරී ක්‍රියාව මගින්, මිලිටරියට යුක්තිකරනයක් සම්පාදනය කෙරුනි.

සෙනසුරාදා, අඛන්ඩ ගුවන් ප්‍රහාර හා කාලතුවක්කු ෂෙල් ප්‍රහාර මධ්‍යයේ, යුද හමුදාව ත්‍රිකුනාමලය අසල එල්ටීටීඊ පාලන ප්‍රදේශයේ කෙලවරක පිහිටි කල්ලාරු හන්දියෙහි සිය කඳවුර ආසන්නයේ දහස් ගනනක සොල්දාදුවන් රැස් කලේ ය. යුද හමුදාවේ මාන්ඩලික ප්‍රධානි නන්ද මල්ලවආරච්චි ප්‍රදේශයේ සංචාරයක යෙදී හමුදාව කල්ලාරු හන්දියේ සිටි කිලෝ මීටර් 4ක් දුරින් පිහිටි මාවිල්ආරු ඉක්මනින් ම අල්ලා ගන්නා බව නිවේදනය කලේ ය. පැය 24ක් ඇතුලත සොරොව්ව විවෘත කිරීමට ආන්ඩුව පොරොන්දු විය.

ඊයේ පස්වරුව වන විට, ප්‍රකාශකයකු කියා පැවේ, සොල්දාදුවන් සිය අරමුනට සමීපව ඇති අතර එහෙත් බිම් බෝම්බ හා මරු වැල් හේතු කොට ගෙන ඉදිරි ගමන සෙමින් සිදු වන බව යි.

අසරන ගොවීන්ට ජලය ලබා දීම අවශ්‍යව ඇතැයි කියාපාමින් කොලඹ ආන්ඩුව සිය ආක්‍රමනික ප්‍රහාරය යුක්තියුක්ත කරයි. ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල මෙසේ ප්‍රකාශ කලේ යඃ “සිවිල් ජනතාවගේ මූලික අවශ්‍යතාවක් වන ජල සැපයුම යලි තහවුරු කිරීමේ මානුෂික පදනම මත සීමිත මෙහෙයුමක් දියත් කර ඇත.”

සේරුනුවර ප්‍රදේශයේ ගොවීන්ගේ ඉරනම පිලිබඳ ආන්ඩුවේ උත්සුකතාව මුලුමනින් ම කුහක ය. පසු ගිය නොවැම්බරයේ දී ඔහු දුන් දීර්ඝ මැතිවරන පොරොන්දු මාලාව තිබිය දී ම, රාජපක්ෂ, ගොවිතැනට අවශ්‍ය ද්‍රව්‍යවල හා උපකරනවල වියදම ඉහල යාම සහ ගොවි නිෂ්පාදන මිල ගනන් පහල බැසීම පිලිබඳ ගැටලුවලට අවධානය යොමු කිරීමට අසමත්ව ඇත. මෙම ගැටලු රට පුරා ගොවීන් මිරිකා දමමින් ඔවුන්ගෙන් සමහරෙක් සිය දිවි නසා ගැනීම කරා ද තල්ලු කර තිබේ.

ආන්ඩුව එල්ටීටීඊය සමග මොන යම් හෝ සම්මුතියක් ඇති කර ගැනීමේ ඉඩකඩ බැහැර කොට, සටන් විරාම ගිවිසුමේ කොන්දේසි යටතේ ඉල්ලා සිටින පරිදි, ඒ ගැන සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කර ඇත. ගැටලුව නිරාකරනය කරගනු වස් එල්ටීටීඊ නායකයන් හා ගොවීන් හමුවීමට ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) දැරූ ප්‍රයත්නයන් මිලිටරිය ප්‍රකෝපකාරී ලෙස කඩාකප්පල් කලේ ය. ජූලි 27 දා ත්‍රිකුනාමලය ආසන්නයේ නැගෙනහිර මුතුර්හි පැවති රැස්වීම අසලට ගුවන් හමුදා බෝම්බ ප්‍රහාර එල්ල කෙරුනි.

එල්ටීටීඊය සටන් විරාමය අධීක්ෂනය කරන නෝර්වේජියානු නායකත්වයෙන් යුත් එස්එල්එම්එම් වෙත කොන්දේසි තුනක් ඉදිරිපත් කලේ ය: එනම්, පොරොන්දු වූ වැව ඉදි කිරීම, එල්ටීටීඊ පාලන ප්‍රදේශ වෙත යන ආහාර, ගොඩනැගිලි ද්‍රව්‍ය හා සෙසු අත්‍යවශ්‍ය සැපයුම් මත පනවා ඇති මිලිටරියේ තහංචිය ඉවත් කිරීම සහ එල්ටීටීඊයේ හා ආන්ඩුවේ පාලන ප්‍රදේශ අතර ගමනාගමනයේ යෙදෙන සිවිල් වැසියන්ට කෙරෙන හිරිහැර නතර කිරීම.

ආරක්ෂක ප්‍රකාශක රඹුක්වැල්ල එල්ටීටීඊයේ ඉල්ලීම් එක හෙලා ම ප්‍රතික්ෂේප කලේ, මෙහෙයුමේ “මානුෂික” එල්ලයන් සාකච්ඡාවන්ට යටත් නොකෙරෙනු ඇතැයි ප්‍රකාශ කරමිනි. ජල සැපයුම කපා හැරීමේ එල්ටීටීඊයේ තීන්දුවට විරුද්ධ වන අතර ම, එල්ටීටීඊ පාලන ප්‍රදේශවල වාසය කරන ජනයා මුහුන දෙන සමාජ අර්බුදය ගැඹුරු කරමින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මත පනවා ඇති ස්වකීය තහංචිය දිගටම පවත්වා ගෙන යාම ගැන ආන්ඩුවට කිසිදු මනස්තාපයක් නැත.

සෙනසුරාදා, එස්එල්එම්එම් ප්‍රධානි උල්ෆ් හෙන්රික්සන් ඇතුලු එස්එල්එම්එම් නිලධාරීන් එල්ටීටීඊය හා ගොවීන් මුන ගැසුනු කල, ගුවන් ප්‍රහාර යලිත් එල්ල විය. හෙන්රික්සන් රොයිටර් ප්‍රවෘත්ති සේවයට මෙසේ පැවසී ය: “අපි වාඩි වෙලා කතා කරමින් සිටියා, ආන්ඩුවෙන් අවසරය ද ලැබුනා. ආන්ඩුව විශ්වාසයට ගන්නා ලෙස එල්ටීටීඊයට ඒත්තු ගන්වන්න අපි උත්සාහ කලා. ඔවුන් පෙනෙන දුරින් බෝම්බයක් අත ඇරියා. ඒක නිවැරදි සංඥාවක් නෙවී.”

එම බෝම්බ ප්‍රහාරය අහම්බයක් නොවී ය. රාජපක්ෂ ආන්ඩුව ජල අර්බුදය විසඳා ගැනීමට උනන්දු නැත. එහි අභිප්‍රාය වී ඇත්තේ එල්ටීටීඊයට එරෙහිව ආක්‍රමනික ක්‍රියාමාර්ගයක් යුක්තියුක්ත කරනු පිනිස එය ගසාකෑම යි.

මිලිටරි ප්‍රහාර මාවිල්ආරු වටා වූ යාබද ප්‍රදේශවලට පමනක් සීමා වී නැත. සෙනසුරාදා, ගුවන් හමුදාව, මඩකලපුවට කිලෝ මීටර් 24ක් වයඹ දෙසින් පිහිටි කරදියනාරුහි එල්ටීටීඊ සම්මන්ත්‍රන ශාලාවකට බෝම්බ දැමී ය. ආන්ඩුවට අනුව, එම ප්‍රහාරයේ දී එල්ටීටීඊ සාමාජිකයන් 40ක් ඝාතනයට ලක් වූ අතර ඉහල පෙලේ එල්ටීටීඊ ප්‍රාදේශීය නායකයන් ඇතුලු තවත් ගනනාවකට තුවාල සිදු විය.

ශ්‍රී ලංකා මිලිටරියේ ක්‍රියාවන් “එල්ටීටීඊයට එරෙහි යුද ප්‍රකාශ කිරීමකට සම” වන බව, එස්එල්එම්එම් වෙත ලියූ ලිපියක, ත්‍රිකුනාමලයේ එල්ටීටීඊ නායක එස්. එලිලන් කෝපාවිෂ්ටව ප්‍රකාශ කලේ ය. “සටන් විරාම ගිවිසුම බිම් මට්ටමේ කිසිදු අයුරකින් ක්‍රියාත්මක නොවන බවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන” ලෙස එස්එල්එම්එම් වෙතින් ඉල්ලා සිටි ඔහු “ශ්‍රී ලංකා හමුදා මාවිල්ආරු ප්‍රදේශයට ඇතුලු වුව හොත්” එල්ටීටීඊය “රුදුරු ලෙස පලි ගන්නා” බවටත් “එය බරපතල ප්‍රතිවිපාකවලට තුඩු දෙනු ඇති” බවටත් අනතුරු ඇඟවී ය.

රට යලි යුද්ධයට ඇද දැමීම පිලිබඳ දේශපාලන වගකීම සෘජුව ම පැටවෙන්නේ රාජපක්ෂ ආන්ඩුව මත ය. පසු ගිය නොවැම්බරයේ රාජපක්ෂගේ තේරී පත් වීමෙන් අනතුරුව, මිලිටරිය, එල්ටීටීඊයට එරෙහි ප්‍රකෝපකාරී ප්‍රහාර මාලාවක් එල්ල කරනු පිනිස, කරුනා කන්ඩායම වැනි, එල්ටීටීඊ විරෝධී සන්නද්ධ කන්ඩායම් සමග හවුල් වී තිබේ. ජවිපෙ හා හෙල උරුමයේ පීඩනය යටතේ ආන්ඩුව එල්ටීටීඊය මත නව ඉල්ලීම් පැටවීමත් සමග, ඊනියා සාම ක්‍රියාදාමයට යලි පන පෙවීමේ ප්‍රයත්නයන් මහත් ව්‍යාකූලතාවකට ලක්ව ඇත.

දිවයිනේ උතුරේ හා නැගෙනහිර සිදු කෙරෙන අප්‍රකාශිත යුද්ධයට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැතැයි ආන්ඩුව හා මිලිටරිය ප්‍රකාශ කර ඇතත්, එල්ටීටීඊ විරෝධී පැරා මිලිටරි කන්ඩායම් සමග ඔවුන්ගේ සමීප සහයෝගිතාව පිලිබඳ සාක්ෂ්‍ය දිගට ම ගොඩගැසෙමින් පවතී. ලක්බිම පත්‍රයේ සෙනසුරාදා පල වූ ප්‍රධාන ලිපිය, මාවිල්ආරු සොරොව්ව විවෘත කිරීමට කරන සටනට සහ ප්‍රදේශයේ එල්ටීටීඊ කඳවුරුවලට එල්ල කෙරෙන ප්‍රහාරවලට කරුනා කන්ඩායම සම්බන්ධ වීම ගැන විස්තර සම්පාදනය කලේ ය.

බුෂ් පාලනාධිකාරය, එල්ටීටීඊය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස තහනම් කිරීමට මෑත මාසවල දී යුරෝපා සංගමයට හා කැනඩාවට බල කිරීම මගින්, එල්ටීටීඊය සම්බන්ධයෙන් වඩා ආක්‍රමනශීලී ආස්ථානයක් ගනු පිනිස රාජපක්ෂ ආන්ඩුව දිරිගන්වා තිබේ. වොෂිංටනයේ මූලිකත්වයෙන් අනතුරුව, මහ බලවතුන් ඒකපාර්ශ්විකව එල්ටීටීඊය හෙලා දක ඇත්තේ කොලඹ ආන්ඩුවට එහි හික්මීම සම්බන්ධයෙන් ප්‍රශංසා කරන ගමන් ය. ආන්ඩුවේ වත්මන් පැහැදිලි සටන් විරාම උල්ලංඝනය සම්බන්ධයෙන් කිසිදු ජාත්‍යන්තර හෙලා දැකීමක් සිදු කර නැත.

මේ අතරතුර පූර්න පරිමාන යුද්ධයක් සඳහා යන ආන්ඩුවේ සූදානම නිර්බාධිතව දිගටම ක්‍රියාත්මක වේ. මෑත මාස ගනනාව තුල දී, එය ඉන්දියාවෙන් හා පකිස්ථානයෙන් පමනක් නොව, චීනයෙන් ද මිලිටරි උපකරන මිලදී ගැනීමට උත්සාහ කර තිබේ. ඔවුන් විශ්‍රාම යා යුතු වයසෙන් පසුවත් මේජර් ජනරාල්වරුන්ගේ මිලිටරි සේවය දීර්ඝ කිරීමට හැකි වන පරිදි සිය බලතල පුලුල් කර ගනිමින්, රාජපක්ෂ පසු ගිය බ්‍රහස්පතින්දා ගැසට් නිවේදනයක් නිකුත් කලේ ය.

සාකච්ඡාමය සාමයක අවශ්‍යතාව ගැන කටින් බතල කොල සිටුවීම තිබිය දී ම, මෑත ම ප්‍රහාරය මගින් පැහැදිලි කෙරෙන්නේ, එල්ටීටීඊය මිලිටරිමය ආකාරයෙන් තලා දැමීමේ මංමුලා සහගත ප්‍රයත්නයක් ලෙස රට යලි යුද්ධයක් තුලට ඇද දැමීම ආන්ඩුවේ එල්ලය වන බව යි.

© www.wsws.org